**රත්නපුර මහා නගර සභාව.**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව සභාවට අයවියයුතු මුද්දර ගාස්තු ප්‍රේෂණ ලැබීමේදී සභාව විසින් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට ගෙවිය යුතු රු. 860,113 ක් අඩුකර තිබුණද, ඊට අදාලව ණයහිමියන්ට හා හිඟ ආදායමට ගැලපීම් කර නොතිබුණි.

(ආ) සභාවට අයත් සිනමා ශාලාවකින් අයවිය යුතු හිඟ කුලී ශේෂය රු. 551,000 ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණද, සභාවේ ගණනය කිරීම් අනුව එය රු. 697,500 ක්

වූයෙන් ණයගැතියෝ රු. 146,500 කින් අඩුවෙන් දැක්වුණි. ඊට අමතරව හිඟ ගාස්තු මත ගණනය කර තිබුණු දඩ මුදල් රු. 1,081,125 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජාතිය ගොඩනැගීමේ බදු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට ගෙවිය යුතු බදු මුදල රු. 95,081 ක් වුවත්, එය රු. 228,375 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වගකීම් රු. 133,294 කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවට අදාල එකතුව රු. 123,148 ක් වූ මුද්දර බදු 2017 වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණද, එය ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ලබාදී තිබූ රු. 54,566,853 ක ණය මුදල නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006 අගෝස්තු 31 දිනැති අංක 29/06/24 දරන ලිපිය ප්‍රකාරව, සභාවට ලැබිය යුතු තානායම් කුලියෙන් සියයට 50 ක් 2004 ජූලි සිට හිලව් කරගෙන තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාල ගැලපීම් කර නොතිබුණි.

(ඊ) වෙරළුප පාර සංවර්ධනය සඳහා වන ණය මුදල සම්බන්ධයෙන් දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීම් අනුව 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලිය රු. 11,390,805 ක් වුවත්, එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී විවිධ වැය විෂයයන් හා ගබඩා අත්තිකාරම් යටතේ මිලදී ගෙන තිබූ එකතුව රු. 962,925 ක් වූ ස්ථාවර වත්කම්, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම හරහා ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් වෙනුවෙන් රු. 3,593,295 ක් අඩුවෙන් වෙන්කිරීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(එ) අහරු චෙක්පත් ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂයේ අහරු චෙක්පත් වටිනාකම රු. 1,029,487 ක් හා ඒ සඳහා ලැබීම් රු. 897,222 ක් වුවද, අහරු චෙක්පත් ගිණුමේ එය පිළිවෙලින් රු. 795,393 ක් සහ රු. 697,362 ක් වශයෙන් සටහන් කර තිබුණි.

(ඒ) අයශීර්ෂ 07 කට අදාලව 2017 වර්ෂයේදී ලැබී තිබුණු එකතුව රු. 622,478 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ජංගම ගිණුම් 04 ක හා ඉතිරිකිරීම් ගිණුම් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා සාරාංශ මුදල් පොත් අනුව ශේෂ අතර වෙනස්කම් වල එකතුව රු. 6,661,260 ක් විය.

(ආ) ගිණුම් විෂයයන් 43 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර එකතුව රු. 118,116,962 ක වෙනසක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ලේඛනය අනුව නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 561,986 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 2,868,074 ක් වූයෙන් රු. 2,306,088 ක නොසැසඳූ වෙනසක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට තානායම් කුලී හිඟ ආදායම රු. 10,532,114 ක් වශයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණද, අදාල තහවුරු ලේඛනය අනුව හිඟ ආදායම රු. 10,437,572 ක් වූයෙන් රු. 94,542 ක නොසැසඳූ වෙනසක් විය.

(ඉ) එකතු කල අගය මත බදු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවට අදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කලයුතු එකතු කල අගය මත බදු මුදල රු. 2,799,077 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 3,655,618 ක් වූයෙන් රු. 856,541 ක නොසැසඳූ වෙනසක් විය.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන අධිකාරිය අංශ ව්‍යාපෘති ණය මුදල රු. 1,559,433 ක් සහ දේශීය ණය සංවර්ධන අරමුදල (ට්‍රැක්ටර්) ණය රු. 600,254 ක් සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොවුණි.

(ආ) දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු. 5,090,349 ක් වූ ගිණුම් ශේෂ 03 ක් සනාථ කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 571 | 1997 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 37,485,459 ක් වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් 2017 අගෝස්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ඌනතා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 | සභාව සතු වාහන 04 කට අදාල දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය** | |
| (i) 4.2 සහ 4.3 වගන්ති | රජයේ නිලධාරීන්ට නිල නිවාස ලබා දීමේදී තෝරා ගැනීමේ උපමාන වලට අනුගත වී නොතිබූ අතර, තෝරා ගැනීම සඳහා සලකා බැලිය යුතු සියළුම කරුණු අනාවරණය කර ගතහැකි වන පරිදි සම්මත ඉල්ලුම් පත්‍ර ආකෘතියක් පිළියෙල කර නොතිබුණි. |

(ii) 5.7 වගන්තිය

නිලධාරියෙකු තම තනතුරට නියමිත නිවාසයක පදිංචි වීම ප්‍රතික්ෂේප කරන විටක, ඒ නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු එහි පදිංචි වීම නිවාස වෙන් කරදෙන බලධරයා අනුමත නොකලහොත් නිවාසය ප්‍රතික්ෂේප කල නිලධාරියා සැබවින්ම එහි පදිංචි වූ ලෙස සලකා ඔහුගෙන් කුලී අය කරගත යුතු වුවත්, නිල නිවාස 02 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය

(i) 1.5 ඡේදය

යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කලයුතු වුවත්, රත්නපුර පොදු වෙළඳපල කඩකාමර සඳහා වර්ෂ 19 ක සිට බදු කුලිය සංශෝධනය කර නොතිබුණි.

(ii) 1.10 ඡේදය

සභාව විසින් දීර්ඝකාලීනව බදු දුන් රත්නපුර මහජනපොළ කඩකාමර 03 ක් මුල් බදුකරු විසින් නම් කරන ලද වෙනත් පුද්ගලයින් වෙත පවරා තිබු අතර, නැවත කුලියට දීම සඳහා ටෙන්ඩර් කිරීම සිදුකර නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 71,376,984 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 46,579,450 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 24,797,534 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 24,797,534 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 03 ක රු. 23,627,947 ක වැඩිවීම හා වියදම් විෂයයන් 02 ක රු. 5,658,473 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 36,500 | 34,424 | 29,505 |
| බදු කුලී | 62,996 | 54,059 | 24,410 |
| බලපත්‍ර ගාස්තු | 6,092 | 1,845 | - |
| වෙනත් ආදායම් | 380,018 | 354,498 | 48,645 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදුකුලී ආදායම, බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 23, සියයට 70, සියයට 82 හා සියයට 42 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

---------

2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 29,504,918 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

### 2.3.4 බදුකුලී

-------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සභාව සතු නිල නිවාස 06 කින් එකතුව රු. 54,072 ක් වූ හිඟ නිවාස කුලී ලැබිය යුතුව පැවතුණි.

(ආ) කඩකුලී ලේඛනය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහජනපොළ කඩකාමර 57 කින් මාස 06 සිට මාස 33 දක්වා වූ කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු. 2,899,420 ක හිඟ කුලී 2017 අප්‍රේල් වනවිටද ලැබී නොතිබුණු අතර, හිඟ කුලී අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි නිකුත් කර තිබුණද, බදු ගිවිසුමේ 4 වන කොන්දේසිය ප්‍රකාරව ඉන් ඔබ්බට වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දින වනවිට කුඩුගල්වත්ත වෙළඳ සංකීර්ණයේ කඩකාමර 07 කට අදාලව එකතුව රු. 1,759,525 ක හිඟ කඩකුලී ශේෂයක් පැවතුණු අතර, 2017 ජුලි වනවිට එයින් රු. 291,930 ක් පමණක් අයවී තිබුණි. තවද, වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ කඩකාමර 03 ක් වසා දමා තිබුණු අතර, බදු ගිවිසුමේ 7.2 කොන්දේසියට පටහැනි ලෙස කඩකාමර 03 ක් බඩු ගබඩා වශයෙන් භාවිතා කරමින් තිබුණි.

(ඈ) රත්නපුර පොදු වෙළඳපල කඩකාමර 02 කට අදාලව පැරණි බදුකරුවන්ගෙන් අයවිය යුතු රු. 626,535 ක් වූ හිඟ කඩකුලී 2017 අගෝස්තු වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

2016 වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභා අරමුදල් යටතේ ඉටුකිරීමට එකතුව රු. 86,600,000 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 15 ක් යෝජනා කර තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින

වනවිට ඉන් කිසිඳු කර්මාන්තයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, අයවැයගත කර්මාන්ත යටතට නොවැටෙන කර්මාන්ත 13 ක් සහා අරමුදලින් රු. 11,672,684 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 මාර්තු 02 දින සිට 04 දින දක්වා මැලේසියාවේ පැවති සම්මේලනයක් සඳහා කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු සහභාගී වීම වෙනුවෙන් 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ කොන්දේසි වලට අනුකූලව විදේශ ගමන් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරී විසින් නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා 05 ක් මඟින් අනාවරණය කර තිබූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධයෙන් අදාල නිවැරදිකිරීම් සිදුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | අභ්‍යන්තර විගණන විමසුමට යොමුව | නිරීක්ෂණය කර තිබූ අඩුපාඩුව |
|---|---|---|
| (i) | RMC/අවිනි/007 | නිල නිවාසයේ පදිංචිකරු විසින් පෞද්ගලික වියදමින් නිල නිවාසය අළුත්වැඩියා කිරීම පිළිබඳ ඉදිරි පරීක්ෂණ සිදු නොකිරීම. |
| (ii) | RMC/අවිනි/008 | මහා නගර සභා ආඥා පනතේ 247(අ) හි (2) උප වගන්තිය ප්‍රකාරව ව්‍යාපාර ස්ථාන වල වාර්ෂික ආදායමෙන් සියයට 01 ක මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස අය නොකිරීම. |
| (iii) | RMC/අවිනි/008 | කුලීරිය රථවාහන නවතා තැබීමේ හිඟ ආදායම අයකර නොගැනීම. |
| (iv) | RMC/අවිනි/018 | රත්නපුර පල්ලිය පාර ලෝක වෙළඳ මධ්‍යස්ථානය පිහිටි ස්ථානය අවිධිමත් ලෙස බදුදෙන ලදුව බදුකරු විසින් අනවසරයෙන් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු නොකිරීම. |

(v) RMC/අවිනි/028 පුළුඟුපිටිය පැල්පොලවත්ත නැමති ඉඩම හා පුළුඟුපිටිය පොදු වැසිකිලිය අවිධිමත් ලෙස බදුදීම හා අනවසර ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු නොකිරීම.

(ඇ) රත්නපුර නගරයේ පිහිටි සභාව සතු සිනමා ශාලාව 2001 මැයි 01 දින සිට 2006 අප්‍රේල් දක්වා වලංගු වන පරිදි ගිවිසුම්ගතවී බදුදී තිබුණද, 2006 මැයි සිට ගිවිසුම වලංගු කර ගැනීමකින් තොරව 2010 අප්‍රේල් 21 දින දක්වා බදුකරු විසින් සිනමා ශාලාව පවත්වාගෙන ගොස් තිබූ අතර, 2010 ජනවාරි 31 දිනට බදුකරුගෙන් අයවිය යුතු මුළු හිඟ මුදල රු. 1,953,000 ක් විය. තවද, මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම පිණිස අදාල ලිපිගොනු 2010 සැප්තැම්බර් 02 දින නීතිඥවරයෙකුට භාරදී තිබුණද, 2017 මාර්තු වනවිටත් නීතිමය පියවර ගෙන නොතිබුණු අතර, හිඟ මුදල සභාව වෙත අයවී නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාතේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සභාව විසින් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 04 කදී එකතුව රු. 2,822,902 ක් වැයකර කළුගඟ අද්දර ඉදිකර තිබූ නාගරික උයන වල්බිහිවී විනාශ වී ඇති බැවින් නිසියාකාරව නඩත්තු කර ප්‍රදේශයේ ජනයාගේ සුභසිද්ධිය උදෙසා යොදවන ලෙස පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් හා සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් 2010 සැප්තැම්බර් 21 දින රත්නපුර මහා නගර සභාවේ නගරාධිපති වෙත උපදෙස් ලබාදී තිබුණද, 2017 මාර්තු 02 දින වනවිටද අදාල නාගරික උද්‍යානය ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම වගකිවයුත්තන් විසින් පැහැර හැර තිබුණි. තවද, විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නාගරික උද්‍යානයේ ආරක්ෂාව සඳහා සවිකර තිබූ ප්‍රධාන ගේට්ටුවේ අගුළු ගලවා සම්පූර්ණයෙන්ම විවෘත කර තිබුණි.

(ii) නාගරික උද්‍යානය වටා ඉදිකර තිබූ කොළ පැහැති දැල් ආවරණය එක් ස්ථානයක ගැලවී අබලන්ව තිබූ අතර, මාර්ගයට මුහුණලා තිබූ කොටසේ ස්ථාන 02 කින් දැල් ආවරණය කැඩී ගොස් තිබීමෙන් අනාරක්ෂිත තත්ත්වයක පැවතුණි.

(iii) නාගරික උද්‍යානය තුල නගරයේ යාචකයින් පිරිසක් විසින් තාවකාලික නවාතැන්පලක් ඉදිකර තිබුණි.

(iv) 2010 වර්ෂයේදී නාගරික උද්‍යානයක් ලෙස ඉදිකිරීමේදී මෙම ස්ථානයේ ක්‍රීඩා උපකරණ, කොන්ක්‍රීට් බංකු ආදිය සවි කිරීමට වියදම් කර තිබුණද, ක්‍රීඩාපිටිය තුල කිසිදු ක්‍රීඩා උපකරණයක් නොතිබුණි.

(v) නාගරික උද්‍යාන භූමියේ අතුරන ලද ගල් කිසිවක් නිරීක්ෂණය නොවූ අතර, භූමිය පුරා වල්බිහිවී තිබුණි.

(ආ) රත්නපුර මහජන පොළ බදු ලබාගෙන තිබූ කඩහිමියන් සමඟ එළඹ තිබුණු බදු ගිවිසුමට පටහැනි ලෙස කටයුතු කර තිබීම පිළිබඳව සභාවේ ක්‍රියාකාරීත්වය යහපත් තත්ත්වයක නොතිබුණි.

(ඇ) කුඩුගල්වත්ත වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ පඩිපෙල ආසන්නයේ ඇති ස්ථාන දෙකෙහි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බාහිර පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලැබී තිබූ ඉල්ලීම මත මුදල් සංස්ථාපිත කටයුතු සහ නීති පිළිබඳ ස්ථාවර කාරක සභාවේ නිර්දේශිත කොන්දේසි වලට යටත්ව බදු ලබාදීම සඳහා 2015 මැයි 08 දිනැති අංක 6:5 දරන සභා තීරණය අනුව කඩකාමර 02 ක් ඉදිකර තිබූ අතර, නාගරික ඉංජිනේරු විසින් 2015 ජූලි 30 දින සභා තීරණය මත ගිවිසුම් අත්සන් කර අනෙකුත් අදාල කටයුතු කිරීමට විෂයය ලිපිකරුට උපදෙස් ලබාදී තිබුණි. එසේ වුවද, 2017 අප්‍රේල් වනවිටත් අදාල විෂයය ලිපිකරු ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, සභාවට කිසිදු බදුකුලියක් ගෙවීමකින් තොරව වර්ෂයකට වඩා වැඩි කාලයක් එක් කඩකාමරයක ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබූ බවත්, වෙනත් බාහිර පාර්ශවයකට බදුකුලියක් ගෙවා තිබූ බවත් විගණනයේදී අනාවරණය විය.

(ඈ) මහා නගර සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී ඍජු ශ්‍රම පදනම මත ඉටුකර තිබූ කර්මාන්ත වෙනුවෙන් ගබඩාවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය නිකුත් කිරීමේදී අවශ්‍යතාවයට වඩා වැඩිපුර නිකුත් කිරීම හේතුවෙන් එකතුව රු. 86,580 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඉ) වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කලයුතු වුවද, 1997 වර්ෂයේ වරිපනම් තක්සේරුව අනුව වරිපනම් අයකරන බවත්, 2005 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම අවස්ථා දෙකකදී මහා සභාව සහ මුදල් කාරක සභාව විසින් ප්‍රමාද කර තිබූ බවත්, 2013 ජූලි 30 දින පැවති මහ සභා රැස්වීමේදී නව තක්සේරුවක් කිරීමට තීරණය කර තිබූ බවත් අනාවරණය විය.

ඒ අනුව, නව තක්සේරුව සඳහා 2014 අප්‍රේල් මාසයේදී තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා තිබූ අතර, දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු මාසයේදී අවශ්‍ය තොරතුරු සභාවෙන් කැඳවා තිබුණද, 2017 ජූලි වනවිටත් අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. වරිපනම් සංශෝධන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීමට ප්‍රමාද කිරීම හේතුවෙන් 2017 වර්ෂයේදී තක්සේරු කටයුතු ඉටුකිරීමට නොහැකි වන බව පළාත් තක්සේරුකරු 2017 ජූලි 12 දින නාගරික කොමසාරිස් වෙත දන්වා තිබුණි.

## 3.4 අවිධිමත් ගනුදෙනු

----------------------

මහා නගර සභාවේ හිටපු ආදායම් පරීක්ෂකවරයෙකුට නිල නිවාසයක් ලබාදී තිබියදී එම නිල නිවසට මායිම්ව ඇති පර්චස් 17.43 ක බිම් කොටස සහ ඒ තුල පිහිටි සියළු දේපල පදිංචිය සඳහා බිම් බදු ක්‍රමය යටතේ 1999 වර්ෂයේදී ලබාදී තිබුණු අතර, මෙම ඉඩම් කොටසෙහි ස්ථිර නිවාසයක් ඉදිකර තිබූ බව 2016 අගෝස්තු 24 දින විගණනය විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී අනාවරණය විය. තවද, සමාලෝචිත වර්ෂයේදී රු. 314,181 ක් වැයකර එම ඉඩමට පිවිසීම සඳහා අඩි 240 ක දිග මාර්ගයක් ඉදිකර තිබුණි. එම මාර්ගය භාවිතා කරන වෙනත් කිසිදු ප්‍රතිලාභියෙක් නොවූ අතර, සභා අරමුදල් උපරිම ඵලදායීතාවයකින් යුතුව උපයෝජනය කිරීමකින් තොරව තනි පුද්ගලයෙකුට වාසිවන අයුරින් වැයකර තිබුණි.

## 3.5 හඳුනාගත් අලාභ

-------------------

සභාවේ ටෙන්ඩර් දැන්වීමක් පුවත්පත් 03 ක පලකිරීම වෙනුවෙන් 2016 ජූනි රු. 69,345 ක් ගෙවා තිබීම හා විධිමත් හා සාධාරණ හේතු නොමැතිව එම දැන්වීම අවලංගු කිරීමේ නිවේදනයක් පලකිරීම වෙනුවෙන් 2016 සැප්තැම්බර් රු. 20,868 ක් ගෙවා තිබීම හේතුවෙන් සභා අරමුදලට රු. 90,213 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ගිවිසුම්ගත වටිනාකම රු. 5,598,069 ක් වූ රත්නපුර නගර ශාලාවේ පළමු මහල වැඩිදියුණු කිරීමේ කර්මාන්තයට (ටයිල් ඇතිරීම, වායුසමනය කිරීම සහ වැසිකිලි අළුත්වැඩියාව) අදාල ලංසු කැඳවීම 2015 වර්ෂයේදී සිදුකර තිබූ නමුත් 2017 අගෝස්තු වනවිටත් වැඩ අවසන් කර නොතිබුණු මෙම කර්මාන්තය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 පෙබරවාරි 02 දිනැති ටෙන්ඩර් පිළිගැනීමේ ලිපිය අනුව කර්මාන්තය ආරම්භ කලයුතු දිනය වශයෙන් 2016 පෙබරවාරි 16 දින දක්වා තිබුණද, ගිවිසුම් අත්සන් කිරීම 2016 ජූලි 04 දින දක්වා ප්‍රමාද කර තිබුණි.

(ආ) 2016 පෙබරවාරි 16 දින කර්මාන්තය ආරම්භ කලයුතු වුවත්, කොන්ත්‍රාත්කරු වෙත නගර ශාලාව වෙන්කර දීම 2016 මැයි 01 දින වනතෙක් ප්‍රමාද කර තිබුණු අතර, ඒ වනවිට කර්මාන්තය ආරම්භ කලයුතු දිනය මාස 02½ ක් ප්‍රමාදවී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 25 දින දක්වා කර්මාන්තයේ දින දීර්ඝ කර තිබූ අතර, 2016 අගෝස්තු 29 දින වනවිට නගර ශාලාවේ වායුසමීකරණ යන්ත්‍ර සවිකර තිබූ අතර, ඒ වෙනුවෙන් රු. 3,718,220 ක් ගෙවා තිබුණි. එසේ වුවද, වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය අනෙකුත් කටයුතු ඉටුකර නොතිබුණු අතර, 2017 අගෝස්තු වනවිටත් එම යන්ත්‍ර නිෂ්කාර්යයව පැවතුණි.

## 3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාවට අයත් කණාදොළ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නොදිරන කසළ වලින් විකිණීමට හැකි ප්ලාස්ටික් බෝතල්, පොලිතින් හා පොල්කටු වැනි දෑ ඉවත් කර ගබඩා කර තිබූ අතර, ඉතිරි ද්‍රව්‍ය විවෘත භූමියේ ගොඩගසා තිබුණි.

(ආ) නගරයේ පොදු වෙළඳපල හා හෝටල් වලින් ඉවත් කරන එළවළු ද්‍රව්‍ය යොදාගෙන කොම්පෝස්ට් පොහොර නිපදවීම සිදුකරනු ලැබුවද, නිවෙස් වලින් එකතු කරන කසළමලු කිසිදු වෙන්කිරීමකින් තොරව එම ස්ථානයේ පිහිටි බැවුම් සහිත විවෘත භූමියට බැහැර කිරීම සිදුකර තිබුණි. එම තත්ත්වය පාරිසරික හා සාමාජීය වශයෙන් විශාල ගැටළුසහගත තත්ත්වයක් ඇතිවිය හැකි බවට විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) කසළ අංගනය අවට ඉතා අවිධිමත් ආකාරයෙන් වීදුරු බෝතල්, විදුලි උපකරණ, පරිගණක උපාංග වැනි නොදිරන අපද්‍රව්‍ය ගොඩගසා තිබූ අතර, ඒවා තුල ජලය එක්රැස්වී මදුරුවන් බෝවීමේ අවදානමක් පැවතුණි.

(ඈ) කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් 2016 වර්ෂයේදී ලැබී තිබූ යන්ත්‍රෝපකරණ 03 ක් නිෂ්කාර්යයව පැවති අතර, එම ව්‍යාපෘතියට අදාල ගොඩනැගිලි ඉදිකර තිබුණද, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 51 කට අදාලව එකතුව රු. 41,100,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 23 කට අදාලව එකතුව රු. 31,670,100 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 83 සිට සියයට 99.8 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

### 4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

-------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම රු. 73,096,371 ක් වූ විගණන විමසුම් 31 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රත්නපුර මහා නගර සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාවේ සඳහන් පහත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් 2017 ජූලි 31 දින වනවිටද අදාල නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.

| | විගණන වාර්තාවට යොමුව | විගණන නිරීක්ෂණය |
|---|---|---|
| (i) | 2.2.4 | රත්නපුර තානායම සඳහා 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා බලපත්‍ර නිකුත් නොකිරීම |
| (ii) | 4.1(ඇ) | ගිණිනිවීමේ ඒකකය සතුව ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් නොමැති වීම |

## 5. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| | | (ii) | නියමිත ආදායම් හඳුනා නොගැනීම |
| | | (iii) | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | මහා නගර සභාව සතු ඉඩම් වල අනවසර ඉදිකිරීම් පැවතීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉදිකිරීම් වල දීර්ඝ ප්‍රමාදයන් පැවතීම |
| (ඉ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |

.